# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

# අයදුම්පත් සඳහා ආරාධනා

## උපකුලපති තනතුර

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වෙනි වගන්තියේ නියමයන් ප්‍රකාරව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ඊළඟ වසර හතරක කාලයකට උපකුලපති තනතුර සඳහා ගැළපෙන සුදුසුකම් ඇති අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, ප්‍රධාන විධායක නිලධාරී මෙන්ම ප්‍රධාන අධ්‍යයන නිලධාරියාද වන අතර, විශ්වවිද්‍යාලයේ ගිණුම් නිලධාරියාද වේ. ඔහු/ ඇය සාගර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ හා අධ්‍යයන කතවුන්සිලයේ යන දෙකෙහිම විධායක කමිටු සාමාජිකයකු මෙන්ම සභාපති ද වේ.

උප කුලපතිවරයා කලින් ධූරයෙන් ඉවත් වුවහොත් හෝ 2014 අංක 31 දරන සාගර විශ්වවිද්‍යාල පනතේ නියමයන් ප්‍රකාරව ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හැර වසර හතරක කාලයක් හෝ ඔහු/ ඇය ඔහුගේ/ ඇයගේ හැට පස්වන වසර සම්පූර්ණ වනතුරු පළමුව එළැඹෙන අවස්ථාව දක්වා තනතුර හොබවනු ඇත.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති සැකසීම හා හඳුන්වාදීම පාලක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය මෙහෙයැවීම උපකුලපති වරයාගේ වගකීම වේ. ඔහු/ ඇය ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගවීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායි අපක්ෂපාතී නායකත්වය යන මූලධර්ම ආරක්ෂා කළ යුතුය.

සාර්ථක අපේක්ෂකයා ශක්තිමත් පර්යේෂණ පැතිකඩක් ඇතුළුව උසස් අධ්‍යාපන ජයග්‍රණ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර. සනාථ කළ නායකත්ව ගුණාංග සහිත උපායමාර්ගික දැක්මක් තිබිය යුතුය. උනන්දුවක් දක්වන විවිධ කණ්ඩායම් සමග වාස්තවිකව අන්තර්ක්‍රියා කිරීමට ඔහුට ඇයට ශක්තිමත් අන්තර්පුද්ගල කුසලතා, ප්‍රතිපත්ති රාමුව පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කැපවීමක් තිබිය යුතුය. තවද විශ්වවිද්‍යාල ප්‍රජාවට සහ සමාජයට ආයතනික සහ පුළුල් අර්ථයෙන් කැපවීම පෙන්නුම් කරමින් විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සහ මෙහෙවර පිළිබඳව අපේක්ෂකයාට ගැඹුරු අවබෝධයක් තිබිය යුතුය.

උප කුලපතිවරයා විශ්වවිද්‍යාල පද්ධතියේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු ලෙස අධ්‍යයන වැටුප් පරිමාණයේ සිටීමට සුදුසුකම් ලබන අතර, මූලික වැටුපෙන් 15% ක විනෝදස්වාද දීමනාවක්, සන්නිවේදන දීමනාවක්, ඉන්ධන දීමනාවක් යනාදියට හිමිකම් කියයි. ඊට අමතරව උප කුලපතිවරයාට රියදුරෙකු සහිත නිල වාහනයකට හිමිකම් ඇත.

**අයදුම්පත් සමග පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.**

(i) අයදුම්කරුගේ උපන් දිනය ඇතුලුව සම්පූර්ණ ජීවදත්ත ප්‍රකාශනයක්, අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙක් වියයුතු අතර, අයදුම්පත් අවසන් කරන දිනට වයස අවුරුදු 63ට අඩු විය යුතුය.

(ii) විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත් වුවහොත් අයදුම්කරු විසින් ඉටුකිරීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.

(iii) වත්මන් උපකුලපති අයදුම්කරුවකු වන හෝ අයදුම්කරු මීට පෙර විශ්වවිද්‍යාලයක උපකුලපති තනතුරක් හෙබවූවකු වන විටදී ඔහු/ ඇය ඉහත (i) සහ (ii) වගන්ති හි සඳහන් ලේඛනයන්ට අමතරව, ඔහුගේ/ ඇයගේ පළමු නිල කාලය තුළ අත්පත් කරගත් ජයග්‍රහ උද්දීපනය කරමින් වාර්තාවක් සැපයිය යුතුය.

(iv) බාහිර අයදුම්කරුවන් සම්බන්ධයෙන් අයදුම්කරු රාජ්‍ය සේවයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු අයෙක් නම් ඔහු/ ඇය මෙම තනතුරට තෝරා පත්කර ගතහොත්, සේවයෙන් මුදා හැරීමට හැකි බවට සේව්‍යයාගෙන් ලිපියක්.

අයදුම්පත්, අධ්‍යක්ෂ (මූල්‍ය), මූල්‍ය අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15 වෙත යොමු කොට 2025 අප්‍රේල් 2 වන දින ප.ව. 3.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ වැඩකරන දිනයකදී මූල්‍ය අංශයේ කාර්යාලය වෙත අතින් ගෙනවිත් භාරදීම කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ "**උප කුලපති තනතුර**" යනුවෙන් සඳහන් කළ යුතුය.

අතිරේක වශයෙන් ඉහත ලිපිලේඛනයන්හි මෘදු පිටපතක් සමග වෙනත් ආධාරක ලිපි ලේඛනයන්හි **PDF** ආකෘතියේ පිටපත් ඉහත සඳහන් අවසන් දිනට හෝ ඊට පෙර මූල්‍ය අංශයේ කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් පසු මාස දෙකක කාලයක් ඇතුළත වැඩ කරන දිනයකදී විශේෂ පාලක මණ්ඩල රැස්වීමක් කැඳවනු ලබන අතර, ඇගයීම් සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා විශේෂ පාලක මණ්ඩල රැස්වීම ඉදිරියට අයදුම්කරුවන් පෞද්ගලිකව කැඳවනු ලැබේ. සියලුම අයදුම්කරුවන්ට අවම වශයෙන් විනාඩි දහයක (10) කාල සීමාවක කෙටි ඉදිරිපත් කිරීමක් කරන ලෙසට ඉල්ලා සිටින අතර, එය විනාඩි පහළොවක (15) නොඉක්මවිය යුතුය. විශේෂ තත්ත්වය තුළ යම් අපේක්ෂකයකුට විශේෂ කවුන්සිල රැස්වීමට පැමිණීමට අවස්ථාවක් නොමැති විට ඔහුට/ ඇයට කවුන්සිලයේ ලේකම්වරයාට පූර්ව දැනුම් දීමක් සහිතව අතථ්‍ය මාදිලිය හරහා පෙනී සිටීමට අවසර ලැබේ.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 03/2023 සහ 2023 අප්‍රේල් 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයේ දක්වා ඇති ආකාරයට තෝරා ගැනීම සිදු කෙරේ. උපකුලපති තනතුරට පත් කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඉහත සඳහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය පරිශීලනය කරන්න. www.ocu.ac.lk සහ www.ugc.ac.lk අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙන් හා වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා නොබැලේ.

**අධ්‍යක්ෂ මූල්‍ය (මණ්ඩලය සඳහා ලේකම්)**
**මූල්‍ය අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,**
**කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15.**
**2025.03.02**